පළාත් අධ්‍යාපන දෙපාර් තමේන්තුව සබරගමුව - සති පාසල

සතිය- 4 (1 වාරය)

විෂය:- :- ගණිතය

සැකසුම :- ඇඹිලිපිටිය අධ්‍යාපන කලාපය

ශ්‍රේණිය:- 8

(ඉගෙනුම් කාලය :- පැය 2 )

## 03. කෝණ

- කෝණයක් මනින ඒකකය අංශකය වේ.අංශක එක $1^0$ ලෙස ලියනු ලබයි.
- කෝණයක විශාලත්වය අනුව පහත දැක්වෙන පරිදි කෝණ වර් ග කළ හැකිය.

1. විශාලත්වය $90^0$ ට වඩා අඩු කෝණ - සුළු කෝණ
2. විශාලත්වය $90^0$ වන කෝණ - සෘජු කෝණ
3. විශාලත්වය $90^0$ ට වඩා වැඩි $180^0$ ට අඩු කෝණ - මහා කෝණ
4. විශාලත්වය $180^0$ වන කෝණ - සරල කෝණ
5. විශාලත්වය $180^0$ ත් $360^0$ ත් අතර කෝණ - පරාවර් ත කෝණ

- පෙළ පොතේ පුනරීක්ෂණ අභ්‍යාසය කරන්න.

3.2 අනුපූරක කෝණ

- කෝණ යුගලයක ඓක්‍යය $90^0$ ක් වන්නේ නම්, එම කෝණ යුගලය අනුපූරක කෝණ යුගලයක් ලෙස හැඳින්වේ.
- ඓක්‍යය $90^0$ වීම සඳහා, දෙන ලද කෝණයකට එකතු කළ යුතු සුළු කෝණය, දෙන ලද කෝණයේ අනුපූරක කෝණය වේ.

  $30^0 + 60^0 = 90^0$ නිසා $30^0$ හි අනුපූරක කෝණය $60^0$ ද,
  $60^0$ හි අනුපූරක කෝණය $30^0$ ද වේ.

3.2 පරිපූරක කෝණ

- කෝණ යුගලයක ඓක්‍යය $180^0$ ක් වන්නේ නම්, එම කෝණ යුගලය පරිපූරක කෝණ යුගලයක් ලෙස හැඳින්වේ.
- ඓක්‍යය $180^0$ වීම සඳහා, දෙන ලද කෝණයකට එකතු කළ යුතු කෝණය, දෙන ලද කෝණයේ පරිපූරක කෝණය වේ.

  $60^0 + 120^0 = 180^0$ නිසා $60^0$ හි පරිපූරක කෝණය $120^0$ ද,
  $120^0$ හි පරිපූරක කෝණය $60^0$ ද වේ.

- පෙළ පොතේ 25,26 පිටු අධ්‍යයනය කර 3.1 අභ්‍යාසය කරන්න.